**දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශිය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2017 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 19 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම් මුල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මුල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල රු.16,000 ක මුද්දර ගාස්තු ආදායම් ගිණුම්ගත කර නොතිබීම නිසා වර්ෂයේ ආදායම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2014 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතු රු.77,000 ක් ගිණුම් ගතකර නොතිබීම නිසා ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2016 වර්ෂයේදී කඩකාමර 49 ක් ඉදිකිරීම සඳහා ලබාගත් ඇප තැන්පත් රු.7,350,000 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබීම නිසා වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2013 දැයට කිරුළ ව්‍යාපෘතිය මඟින් ඉදිකරන ලද රු.25,523,500 ක් වටිනා දෙහිඅත්තකණ්ඩිය ආදාහනාගාරය 2016 පෙබරවාරි 03 දින සභාව වෙත පවරා දී තිබුණ ද, එහි වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල ඉටු කරන ලද ව්‍යාපෘති 02 කට අදාලව 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.896,594 ක් කර්මාන්ත ණයහිමියෝ ලෙස දක්වා නොතිබීම හේතුවෙන් වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ලිහිණියාගම කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්ලාස්ටික් කැබලි කිරීමේ යන්ත්‍රය ලබාගැනීමේ ව්‍යාපෘතියට අදාල කටයුතු 2017 දෙසැම්බර් 31 දින වන විට ඉටුකර නොතිබූ නමුත්, කර්මාන්ත ණයහිමියෝ ලෙස රු.1,000,000 දක්වා තිබීම නිසා වගකීම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) 2017 වර්ෂයේ දෙහිඅත්තකණ්ඩිය සතිපොළ ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව ලබාගත් කොන්ත්‍රාත්කරු එම කොන්ත්‍රාත්තුව සිදු නොකිරීම නිසා අයවිය යුතු රු.58,000 ක ලංසු ඇපකරය වත්කමක් ලෙස දක්වා නොතිබුණි.

### 1.3.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති සහ රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ප්‍රාදේශීය සභා රීති 180 හා 181 | - | සභාවේ ආදායම් එකතු කිරීම, ගබඩා පාලනය, චෙක්පත් නිකුත් කිරීම වැනි රාජකාරි වලට අදාල නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 | . | සභාව සතු වාහන 04 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 භාණ්ඩාගාර චක්‍රලේඛය | 1,698,000 | පරිගණක හා පරිගණක උපාංග ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,587,392 ක්, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,095,504 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් සහ හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 1,544 | 1,596 | 1,116 | 2,264 | 1,579 | 1,624 | 2,481 | 1,784 |
| (ii) කුලී | 8,118 | 8,830 | 8,351 | 521 | 5,926 | 5,836 | 5,805 | 42 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,441 | 1,804 | 1,815 | 20 | 1,346 | 1,565 | 1,595 | 32 |
| (iv) වෙනත් ආදායම් | 1,833 | 2,306 | 2,198 | 188 | 2,308 | 1,743 | 1,766 | 80 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාව විසින් 2017 දෙසැම්බර් 31 දිනට අයකල යුතු මුළු ආදායම රු.16,474,513 ක් වූ අතර, වර්ෂය තුල රු.13,480,299 ක් අයකර ගෙන තිබුණි. ඒ අනුව ආදායම් රැස් කිරීම සියයට 82 ක මට්ටකම පවතින බව නිරීක්ෂණය විය.

**2.2.3 වරිපනම් හා බදු**

2011 වර්ෂයේ වරිපනම් තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදී වරිපනම් අය කරගෙන තිබුණි. හිඟ වරිපනම් ලේඛනය අනුව 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් රු.2,264,129 ක් වූ අතර, හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**2.2.4 කුලී**

2017 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ කුලී ආදායම් රු.521,085 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**2.2.5 බලපත්‍ර ගාස්තු**

2017 දෙසැම්බර් 31 දිනට පැවති නොගෙවූ බලපත්‍ර ගාස්තු රු.20,500 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.188,500 ක් හා මුද්දර ගාස්තු රු.77,000 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සදුන්පුර ග්‍රාමෝදය මණ්ඩලය සහ නාමල්ඔය ප්‍රාදේශීය සභාව වෙත පිළිවෙලින් රු.25,000 ක සහ 15,000 ක ලබාදී තිබුණු අත්තිකාරම් 2018 වර්ෂය වන විටත් නිරවුල් කරගෙන නොතිබුණි.

(ආ) සභාව සතු ධාවන මට්ටමේ පවතින වාහන 20 කින් වාහන 10 ක් සඳහා පමණක් ආදායම් බලපත්‍ර ලබාගෙන තිබුණු අතර, ඉතිරි වාහන 7 සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඇ) දෙහිඅත්තකණ්ඩිය සතිපොළ අලුත්වැඩියා කිරීම් ව්‍යාපෘතිය ලබාගත් කොන්ත්‍රාත්කරු එම ව්‍යාපෘතිය ඉටු නොකිරීම මත ඔහුගෙන් අයවිය යුතු රු.58,000 ක ලංසු ඇපකරය 2018 මැයි 23 දින වනවිටත් මුදල් කරගෙන නොතිබුණි.

### 3.2 මානව සම්පත් කළමනාකරණය

2017 දෙසැම්බර් 31 දිනට කාර්යමණ්ඩලයේ තනතුරු 08 ක් සඳහා නිලධාරීන් 11 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශයේ දුරකථන කුළුණු 07 ක් පැවතිය ද ඒ සඳහා වර්ෂය තුල අයවිය යුතු බලපත්‍ර ගාස්තු රු.21,000 අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවට අයත් කඩකාමර 5 ක් සඳහා මාසික කුළිය අයකිරීම 2008 සිදුකල තක්සේරුව පදනම් කරගෙන සිදුකර තිබුණු අතර, නව තක්සේරු වටිනාකම් මත ආදායම ලබා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 නඩත්තුව හා අලුත්වැඩියා නොකිරීම

සභාව සතු වාහන 10 ක් අලුත්වැඩියා කළ යුතු තත්වයේ පැවැතිය ද එම වාහන අලුත්වැඩියා කිරීමෙන් තොරව සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

#### 3.4.2 පවරා නොගත් වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මහවැලි අධිකාරිය, රාජ්‍ය නොවන සංවිධාන හා මුදල් අමාත්‍යාංශය මඟින් සභාවට ලබාදුන් වාහන 06 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මහවැලි අධිකාරිය විසින් සභාව වෙත ලබා දී තිබූ මුලු භූමි ප්‍රමාණය අක්කර 32.67 ක් වූ ක්‍රීඩා පිටි 26 ක අයිතිය පවරා ගෙන නොතිබුණි.

(ඇ) මහවැලි අධිකාරිය විසින් සභාව වෙත ලබාදී තිබුණු සුසාන භූමි ලෙස භාවිතා කරන මුළු භූමි ප්‍රමාණය අක්කර 37.9 ක් වූ ඉඩම් කැබලි 34 ක් හා භූමි ප්‍රමාණය ගණනය නොකල බිම් කොටස් 2 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

**3.4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

2013 දැයට කිරුළ වැඩසටහන යටතේ රු.39,500,094 ක් වැයකර ඉදිකර තිබුණු දෙහිඅත්තකණ්ඩිය පිහිණුම් තටාකය 2018 පෙබරවාරි 27 දින සභාව වෙත පවරා තිබුණ ද 2018 මැයි 23 දින විටත් ප්‍රදේශවාසීන්ගේ ප්‍රයෝජනය සඳහා විවෘත කර නොතිබුණි.

**3.4.4 වාහන උපයෝජනය**

සභාව සතු රු.6,009,602 ක් වටිනා ටිපර් රථය ධාවන තත්වයේ පැවතියද, සමාලෝචිත වර්ෂය තුල කිලෝමීටර 105 ක් පමණක් ධාවනය කර තිබුණි.

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව සභාව විසින් 2017 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය වියදම අතර සියයට 09 සිට සියයට 62 දක්වා පරාසයක විචලනයක් පැවති බැවින් අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

| | **පද්ධතිය** | **අඩුපාඩුව** |
|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | (i) හිඟ ආදායම් අයකර නොගැනීම. |
| | | (ii) අතුරු ව්‍යවස්ථා පනවා නොතිබීම. |
| | | (iii) ආදායම් ප්‍රභව හඳුනා නොගැනීම. |

| | | |
|---|---|---|
| (ආ) | අයවැය පාලනය | අයවැය නිසිලෙස පිළියෙල කර නොතිබීම. |
| (ඇ) | ගබඩා පරිපාලනය | භාණ්ඩ ගබඩා කිරීම නිසි පරිදි සිදු නොවීම. |
| (ඈ) | වත්කම් පාලනය | ස්ථාවර වත්කම්වල අයිතිය පවරා නොගැනීම. |
| (ඉ) | ගිණුම්කරණය | වත්කම් ගිණුම්ගත කර නොතිබීම. |